# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1853/18 – 2014 මාර්තු 12 වැනි බදාදා – 2014.03.12

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයෙන් එම උපලේඛනයේ දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥා පනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2014 අප්‍රේල් 02 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, ඒ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද එහි අඩංගු විය යුතුය.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
**සභාපති,**
තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය
පිළිබඳ පඩි පාලක සභාව.

2014 මාර්තු මස 06 වැනි දින,
කොළඹ 05
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

1A – G19234 – 70 (2014/03)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1945 ජූලි මස 31 වැනි දින අංක 9441 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, වරින්වර වෙනස් කරන ලද්දාවූ ද අවසන් වරට 2003.05.29 දින පළ කරන ලද අංක 1290/10 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ එකී II වන කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

**II වන කොටස**

**කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය**

| | |
|---|---|
| කම්කරු - (ගැහැණු / පිරිමි) | රු. 405.00 |

03 - 798